# යළි පිබිදවිය හැකි දේශීය මිරිස් වගාව

ශ්‍රී ලංකාවේ ආර්ථිකය අතීතයේ සිට ම කෘෂිකර්මය පදනම් කොටගත් ආර්ථිකයක් වන අතර ශත වර්ෂ ගණනාවකට පෙර සිට ම විශිෂ්ඨ තාක්ෂණයෙන් නිර්මාණය වූ වාරි පද්ධතියකට ද උරුමකම් කිමිය. ශතවර්ෂ ගණනාවක් තුළ සම්ප්‍රදායික දැනුම් සම්භාරයකින් යුක්ත, වී වගාව මෙහි ප්‍රධාන වන අතර අතිරේක ආහාර භෝග වගාව ද වැදගත් අංශයකි. අතිරේක භෝග වර්ග අතරින් මිරිස් වගාව සැලකිය යුතු අංශයක් වන්නේ, "මිරිස්" ශ්‍රී ලාංකික ජනතාවගේ දෛනික ආහාර සැකසුමේ දී අත්‍යාවශ්‍ය වූ අංගයක් බැවිණි.

කැප්සිකම් ඇනම් (Capcicum annum) යන විද්‍යාත්මක නමින් හඳුන්වන මිරිස් "සොලනේසී" කුලයට අයත් වන අතර ශ්‍රී ලංකා වාසීන්ට අත්‍යවශ්‍ය ප්‍රධාන ආහාරයක් තරමට ම වටිනා භෝගයකි. පෝෂණ ගුණය සම්බන්ධයෙන් සුවිශේෂී වැදගත්කමක් හිමි නොවුව ද, ආහාර සැකසීමේ දී අත්‍යවශ්‍ය කුළු බඩුවක් වශයෙන් සුවිශේෂී ස්ථානයක් හිමිකරගෙන ඇත. මුහුදු මට්ටමේ සිට මීටර 1600 (අඩි 5200) පමණ උස් ප්‍රදේශ දක්වා මිරිස් වගා කළ හැකි අතර ඒ සඳහා හොඳින් හිරු එළිය සහිත උණුසුම් කාලගුණයක් අවශ්‍ය වේ. ඒ අනුව, ශ්‍රී ලංකාවේ බොහෝ කෘෂි දේශගුණික කලාපවල පහසුවෙන් මිරිස් වගාව සිදු කළ හැකිය. වියළි කලාපය තුළ මාස් කන්නයේ දී වර්ෂා පෝෂිත ගොඩ භෝගයක් වශයෙන් ද යල කන්නයේ දී ප්‍රධාන වශයෙන් ජල සම්පාදිත භෝගයක් ලෙස කුඹුරුවල ද, කෘෂි ළිං ආශ්‍රිතව ද මිරිස් වගාව සිදු කළ හැකි බැවින් මිරිස් වගාව සිදු කෙරෙන ප්‍රධානම නිෂ්පාදන ප්‍රදේශය වශයෙන් වියළි කලාපය හැඳින්විය හැකි වුව ද, මෙම භෝගය ශ්‍රී ලංකාව පුරාම වගා කළ හැකි භෝගයක් වශයෙන් හැඳින්විය හැකිය. මිරිස්, යල - මහ දෙකන්නයේ ම වගා කළ හැකි අතර මිරිස් වගා බිම් ප්‍රමාණයෙන් 60% ක් පමණ ම වගා කරනු ලබන්නේ මහ කන්නයේ දී ය. මිරිස් අස්වනු සාමාන්‍යයෙන් අප්‍රියෙල් මාසයේ සිට ජුනි ද, සැප්තැම්බර් මාසයේ සිට ඔක්තෝම්බර් මාසය දක්වා ද වෙළඳපළට ලැබේ. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ කුටුම්භ ආදායම් හා වියදම් පිළිබඳ සමීක්ෂණයට අනුව 1990/91 යන කාලය තුළ පාරිභෝගිකයන්ගේ මුළු පරිභෝජනයෙන් 2.37% ක් වශයෙන් මිරිස් පරිභෝජනය පැවති අතර එය සාපේක්ෂව ඉහළ පරිභෝජන මට්ටමකි. 2003/ 2004 වර්ෂයේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන ලද පාරිභෝගික හා සමාජ ආර්ථික සමීක්ෂණයට අනුව මාසික ඒක පුද්ගල වියළි මිරිස් පරිභෝජනය ග්‍රෑම් 44.76 ක් වන අතර ඒක පුද්ගල මාසික අමු මිරිස් පරිභෝජනය ග්‍රෑම් 137.91 ක් වේ. එසේම මාසික ඒක පුද්ගල මිරිස් කුඩු පරිභෝජනය ග්‍රෑම් 102.76 ක් වශයෙන් ද පෙන්නුම් කරයි. සාමාන්‍යයෙන් ඒක පුද්ගල වාර්ෂික මිරිස් පරිභෝජනය කිලෝ ග්‍රෑම් 2 කට ආසන්න ප්‍රමාණයක් වන අතර මෙය 1978 වර්ෂයේ සිට මේ දක්වා ම අදාළ වේ. මෙමගින් පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාව තුළ මිරිස් පරිභෝජනය සුවිශේෂී ලෙස වෙනස්කම්වලට භාජනය නොවන බවත් පුද්ගල ආදායම හා මිරිස් පරිභෝජනය අතර දැඩි සබන්ධතාවයක් ද හඳුනා ගත නොහැකි බවයි. කෙසේ නමුත් වතු අංශය ආශ්‍රිතව මිරිස් පරිභෝජනය ඉහළ මට්ටමක පවතින අතර ග්‍රාමීය අංශය තුළ එය සැලකිය යුතු මට්ටමක පවතී.

මිරිස් වගා කරනු ලබන ප්‍රධාන ප්‍රදේශ වශයෙන් අනුරාධපුර, මහවැලි H, කුරුණෑගල, හම්බන්තොට, මොණරාගල, යනා දී දිස්ත්‍රික්ක හා ප්‍රදේශ හඳුනාගත හැකි අතර 1995 සිට 2005 දක්වා ගනු ලැබූ තොරතුරුවල සාමාන්‍යක් වශයෙන් ගත් විට අනුරාධපුර දිස්ත්‍රික්කය, ප්‍රධාන වන අතර එය මුළු මිරිස් වගා බිම් ප්‍රමාණයෙන් 27.5% ක් වේ. මුළු නිෂ්පාදනයෙන් ද 32.2%ක් සැපයෙන්නේ එම ප්‍රදේශයෙනි. එම තොරතුරු පහත වගුව මඟින් පෙන්නුම් කළ හැකිය.

1970 - 1978 වන තෙක් කලාය තුළ මිරිස් වගා බිම් ප්‍රමාණය සැලකිය යුතු මට්ටමේ ඉහළ තත්ත්වයක පැවතුනි. 1970 දී අනුගමනය කරන ලද ආරක්ෂණවාදී ප්‍රතිපත්තිය යටතේ මිරිස් නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා රාජ්‍ය අංශයේ

### ප්‍රධාන දිස්ත්‍රික්ක කිහිපයක මිරිස් වගා බිම් ප්‍රමාණය සහ නිෂ්පාදනය (වර්ෂ දහයක සාමාන්‍ය අගයන්ට අනුව)

| දිස්ත්‍රික්කය | වගාබිම් ප්‍රමාණය | | නිෂ්පාදනය | |
|---|---|---|---|---|
| | හෙක්ටයාර | % | මෙට්‍රික් ටොන් | % |
| අනුරාධපුර | 6705.9 | 27.5 | 22544.1 | 32.2 |
| මහවැලි H | 2860.6 | 11.8 | 6898.1 | 9.9 |
| කුරුණෑගල | 1757.9 | 7.2 | 4430.6 | 6.3 |
| හම්බන්තොට | 1584.8 | 6.5 | 3465.8 | 5.0 |
| මොනරාගල | 1364.6 | 5.6 | 3240.5 | 4.6 |
| මාතලේ | 1309.9 | 5.4 | 4972.8 | 7.1 |
| පුත්තලම | 967.8 | 4.0 | 2946.6 | 4.2 |
| අනිකුත් | 7790.8 | 32.0 | 21445.4 | 30.7 |
| | 24342.5 | 100.0 | 69943.8 | 100.0 |

*මූලාශ්‍රය : අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.ගො.ප.පු.ආයතනය*

මැදිහත් වීම හා ආනයන අධෛර්යමත් කිරීම සිදු විය. 1970 දශකයේ අග භාගයේ සිට ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ ප්‍රතිපත්තිය, වෙළඳාම ලිහිල් කිරීම සඳහා ප්‍රවණතාවක් දැක් වූ අතර ඒ සමගම පෙර වර්ෂ හා සැසඳීමේ දී මිරිස් වගා කරන ලද බිම් ප්‍රමාණය ක්‍රමිකව අඩු වීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරන ලදී. කෙසේ නමුත්, ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කෙරෙන මිරිස් ප්‍රමාණය මුළු දේශීය පාරිභෝගික අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට ප්‍රමාණවත් නොවන බැවින් එම රික්තය සම්පූර්ණ කිරීම සඳහා විදෙස් රටවලින් ආනයනය කරනු ලබයි. ශ්‍රී ලංකාවට මිරිස් ආනයනය කරනු ලබන ප්‍රධාන ම රට වශයෙන් ඉන්දියාව හඳුනාගත හැකි අතර බොහෝ විට ආනයන ප්‍රමාණයෙන් 90% කට ත් වැඩි ප්‍රමාණයක් සැපයන්නේ ඉන්දියාවෙනි. ඇතැම් අවස්ථාවල පාකිස්ථානය, චීනය, බංග්ලාදේශය හා හොංකොං යන රටවලින් ද සුළු ප්‍රමාණයක් ආනයනය සිදු කෙරේ. 1989 වර්ෂයෙන් පසු නැවත දේශීය මිරිස් වගා බිම් ප්‍රමාණයේ යම් කිසි ඉහළ යාමේ ප්‍රවණතාවක් දක්නට ලැබුන අතර මේ සඳහා හේතු වුයේ ලෝක වෙළඳපළේ මිරිස්වල මිල ඉහළ යාම නිසා ආනයන සීමා වීම මත දේශීය මිරිස්වලට යහපත් වෙළඳපළක් නිර්මාණය වීමයි. වර්ෂ කිහිපයක් පුරා මිරිස් නිෂ්පාදනය හා ආනයන ප්‍රමාණය පහතින් දැක් වේ.

1977 න් පසුව ඇති වූ විවෘත ආර්ථික ප්‍රතිපත්තියෙන් පසු කාලීනව ද මිරිස් ආනයනය කිරීමේ ඒකාධිකාරී බලය රජය සතු විය. මේ තත්ත්වය 1992 දක්වාම පැවති අතර 1993 වර්ෂයේදී ද සමූපකාර තොග සංස්ථාව විසින් මිරිස් ආනයනය සිදු කරන ලදී. ආනයන සඳහා රාජ්‍ය ඒකාධිකාරී බලය පැවති වකවානුව තුළ මිරිස් ආනයන යම් මට්ටකට සීමා වූ අතර දේශීය අස්වනු නොලැබෙන කාලවල බොහෝ විට ආනයනය සිදු කරන ලදී. මේ තත්ත්වය තුළ දේශීය ගොවියා යම් මට්ටමකට ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙළක් පැවතුණි. 1994 දී දියත් කළ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ අත්තනෝමතික නිදහස් කිරීම හේතු කොට ගෙන මිරිස් ආනයනය සම්පූර්ණයෙන් ම නිදහස් කරන ලද අතර ඒ අනුව දේශීය වෙළඳපළ ඉන්දියානු ඇතුළු විදේශීය

## 1975 - 2005 කාලය තුළ මිරිස් වගා බිම් ප්‍රමාණය, නිෂ්පාදනය හා ආනයන පිළිබඳව දත්තයන්

| වර්ෂය | වගා බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) | නිෂ්පාදනය(මෙ.ටො.) | | ආනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් (වියලි මිරිස්) | ඒක පුද්ගල වාර්ෂික පරිභෝජනය | මුළු පරිභෝජනය (මෙට්‍රික් ටොන්) |
|---|---|---|---|---|---|---|
| | | අමුමිරිස් | වියළි මිරිස් | | | |
| 1975 | 49495 | 37607 | 9402 | - | 0.65 | 8810 |
| 1976 | 54581 | 45535 | 10884 | - | 0.65 | 8954 |
| 1977 | 51706 | 42973 | 10743 | - | 0.65 | 9101 |
| 1978 | 50198 | 38586 | 9647 | - | 1.72 | 24384 |
| 1979 | 35959 | 46364 | 11591 | 2304 | 1.72 | 24869 |
| 1980 | 38321 | 50987 | 12747 | 8887 | 1.72 | 25329 |
| 1981 | 40985 | 37513 | 9378 | 13384 | 1.72 | 25795 |
| 1982 | 37143 | 36445 | 9111 | 580 | 1.72 | 26111 |
| 1983 | 34755 | 40609 | 10152 | 3363 | 1.72 | 26491 |
| 1984 | 29402 | 73667 | 18417 | 9285 | 1.72 | 26805 |
| 1985 | 30862 | 98723 | 24681 | 8154 | 1.72 | 27214 |
| 1986 | 35667 | 105734 | 26434 | 4117 | 1.94 | 31235 |
| 1987 | 25128 | 73501 | 18375 | 3312 | 1.94 | 31708 |
| 1988 | 27130 | 82690 | 20673 | 2100 | 1.94 | 32144 |
| 1989 | 24351 | 67869 | 16967 | 8789 | 1.94 | 32570 |
| 1990 | 32987 | 106615 | 26654 | 1388 | 1.94 | 32932 |
| 1991 | 28975 | 99509 | 24877 | 1327 | 1.94 | 33425 |
| 1992 | 30454 | 75798 | 18950 | 7665 | 1.94 | 33731 |
| 1993 | 34598 | 94699 | 23675 | 6846 | 1.94 | 34146 |
| 1994 | 36516 | 93014 | 23254 | 934 | 1.94 | 34622 |
| 1995 | 30592 | 85358 | 21340 | 8346 | 1.94 | 35101 |
| 1996 | 26098 | 73866 | 18467 | 10820 | 1.78 | 32604 |
| 1997 | 24138 | 72231 | 18058 | 9946 | 1.78 | 33026 |
| 1998 | 21632 | 62470 | 15618 | 13269 | 1.78 | 33421 |
| 1999 | 21751 | 60031 | 15008 | 19211 | 1.78 | 33900 |
| 2000 | 19832 | 55860 | 13965 | 20359 | 1.78 | 34463 |
| 2001 | 17353 | 49042 | 12261 | 23364 | 1.78 | 33347 |
| 2002 | 16287 | 46349 | 11587 | 25898 | 1.78 | 33836 |
| 2003 | 15918 | 46190 | 11548 | 25337 | 1.77 | 34081 |
| 2004 | 13748 | 40474 | 10119 | 27686 | 1.77 | 34417 |
| 2005 | 17308 | 52870 | 13218 | 24323 | 1.77 | 34817 |

*මූලාශ්‍රය : අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.ගො.ප.පු.ආයතනය*

හෝගවලින් පිරියාම හේතු කොට ගෙන මිරිස් ඇතුළු බොහොමයක් භෝග වගාවන්හි ශීඝ්‍ර පසුබෑමක් සිදුවිය. දේශීය මිරිස් වගාව ක්‍රමයෙන් පසුබෑමකට ලක් වීමේ දී ආනයන ප්‍රමාණය සහ ආනයන වියදම ක්‍රමයෙන් වර්ධනය වීමක් පෙන්නුම් කරනු ලබයි. ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත අමු මිරිස්, නයි මිරිස් සහ කොච්චි මිරිස් සඳහා මැද පෙරදිග ප්‍රධාන කොටගත් විදේශ ඉල්ලුමක් පැවතිය ද දේශීය නිෂ්පාදනයේ අඛණ්ඩ සැපයීමක් නොමැති වීම මත මෙම විදේශ ඉල්ලුම් රඳවා ගැනීම අපහසු වී ඇත. එමෙන් ම, පවතින නිෂ්පාදනය, ජාතික අවශ්‍යතාවය සපුරාලීම සඳහා ප්‍රමාණවත් නොවන බැවින් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වැය කොට මිරිස් ආනයනය කරනු ලබයි.

විවෘත ආර්ථික ප්‍රතිපත්තියත් සමඟ ම විශාල වශයෙන්, ආනයනය කරන මිරිස් තොග නිසා දේශීය ගොවියාට සිය නිෂ්පාදන අලෙවි කර ගැනීමට පවතින දුෂ්කරතාවය, ගොවීන් මිරිස් වගාව අත්හැර දැමීමට බලපාන ලද එක් සාධකයක් පමණි. 1997 වන විටත් රජරට ප්‍රදේශයේ මිරිස් වගාව ඉහළ මට්ටමක පැවති අතර ඒ වන විට රටේ වාර්ෂික පරිභෝජනයට අවශ්‍ය මිරිස් ප්‍රමාණයෙන් 42%ක් ම නිෂ්පාදනය කරන ලද්දේ මහවැලි "එච්" කලාපය මුල් කොටගත් රජරට ගොවීන් විසිනි. තම අස්වැන්න නිසි මිලට, නිසි කලට අලෙවිකර ගැනීමේ අපහසුතාවය මත බොහෝ ගොවීන් මිරිස් වගාවෙන් ක්‍රම ක්‍රමයෙන් ඉවත් වන්නට විය. 2004 වර්ෂය වන විට, රජරට මිරිස් නිෂ්පාදනය 4% දක්වා පසුබෑමකට ලක් ව ඇත. වෙළඳපළ ප්‍රශ්නයට අමතරව බලපානු ලබන වෙනත් දුෂ්කරතා ද පවතී. අනිකුත් ආහාර භෝග වගාවට සාපේක්ෂව සාමාන්‍යයෙන් මිරිස් සඳහා වැයවන නිෂ්පාදන පිරිවැය ඉහළ මට්ටමක පවතී. පොහොර, කෘමිනාශක හා අනෙකුත් රසායනික යෙදවුම් වැඩි වශයෙන් භාවිතා කිරීම මෙයට හේතුවයි. මිරිස් සඳහා වැය වන නිෂ්පාදන පිරිවැය වාරි මාර්ග ක්‍රමය හා භූගෝලීය පිහිටීම යන සාධක මත දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට වෙනස් වනු ලබන අතර සාමාන්‍යයෙන් මිරිස් සඳහා වැය වෙන නිෂ්පාදන පිරිවැය ක්‍රමයෙන් ඉහළ යාමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරනු ලබයි. උසස් වර්ගයේ බීජ සපයා ගැනීම ද සාපේක්ෂව වැඩි වශයෙන් මිරිස් වගාවට පලිබෝධ හා රෝගාබාධ ඇතිවීම ද තවත් ගැටලුවකි. මෙවන් පසුබිමක වගා කොට ලබා ගන්නා මිරිස් අස්වැන්නට සාධාරණ වෙළඳපළක්, මිලක් නොමැතිවීම මත ගොවීන් මිරිස් වගාව ක්‍රමයෙන් අතහැර දැමීමට පෙළඹුනහ. දේශීය මිරිස් බීජ වලට හුරු වී සිටි ගොවීන් විදේශීය බීජ මිරිස් වලට නැඹුරුවන්නට වූ අතර මෙම දෙමුහුන් බීජ සිටුවීමෙන් ලබාගන්නා අස්වනුවලින් නැවත බීජ ලබාගත නොහැකි වීම නිසා කන්නයක් පාසා ගොවීන්ට බීජ මිරිස් වෙළඳපළෙන් මිල දී ගැනීමට සිදු විය. එමෙන් ම, මෙම බීජ වලට වැඩි වශයෙන් රසායනික පොහොර අවශ්‍ය වීම ද, ඒ නිසාම නිතර නිතර කෘමිනාශක යෙදීමට සිදු වීම ද, මිරිස් ගොවීන්ගේ වියදම් වැඩි කරන සාධක වූ අතර ගොවීන් මිරිස් වගාවෙන් ඈත් වීම කෙරෙහි මෙම සාධක ද යම්තාක් දුරකට බලපාන ලදී.

වර්තමානය වන විට මිරිස් නිෂ්පාදනය කරනු ලබන බොහෝ ගොවීන් තම නිෂ්පාදන වෙළඳපළට ඉදිරිපත් කරනු ලබන්නේ අමු මිරිස් වශයෙනි. වියලි මිරිස් කිලෝග්‍රෑම් 1 ක් සකසා ගැනීමට ඉදුණු මිරිස් කිලෝ ග්‍රෑම් 3 ක් හෝ 4ක් අවශ්‍ය බැවින් ද, සකසා ගැනීම සඳහා ගතවන කාලය හා පිරිවැය ගැන සැලකීම තුළින් ද, ඉක්මණින් මුදල් ලබාගැනීමේ අවශ්‍යතාවය මත ද ගොවීන් වැඩි වශයෙන් අමු මිරිස් වෙළඳපළට ඉදිරිපත් කරනු ලබයි.

ඉහත සියලු කරුණු පිළිබඳව සලකා බැලීමේ දී පැහැදිලි ව කරුණක් වන්නේ ශ්‍රී ලංකා වාසීන්ගේ දෛනික පරිභෝජන අවශ්‍යතාවයන්හි දී නැතිවම බැරි ආහාරයක් සේ සැලකිය හැකි මිරිස් වගාව, පෙර පැවති සශ්‍රීක තත්ත්වයට නැවතත් පත් කරගත හැකි නම් ඒ සඳහා වැයවන විශාල විදේශ විනිමය ප්‍රමාණයක් රටතුළ ඉතිරි කර ගත හැකි බවයි.

එමෙන්ම, දේශියව අවශ්‍ය වන මිරිස් ප්‍රමාණය පමණක් නොව විදේශීය අවශ්‍යතා සඳහා සැපයීම සඳහා ද මිරිස් නිපදවීමේ හැකියාවක් අපට පවතී. වත්මන් රජයේ මාර්ගෝපදේශකත්වය යටතේ වගාකළ හැකි සෑම බිම් අඟලක් ම වගා කිරීමේ

පරමාර්ථය සහිතව 2000 - 2010 දේශීය ආහාර නිෂ්පාදන දිරිගැන්වීමේ ජාතික මෙහෙයුම "අපි වවමු - රට නගමු" යන තේමාව යටතේ ක්‍රියාත්මක කිරීම මගින් දේශීය භෝග වගාව දිරි ගැන්වීමේ ප්‍රවණතාවයක් මතු වීම මහත් භාග්‍යයකි. එසේ නිෂ්පාදන වැඩි කිරීමට අපේක්ෂිත භෝග අතරින් අතිරේක භෝග යටතේ මිරිස් වගාවට ද සුවිශේෂී ස්ථානයක් හිමි වී තිබේ. ඒ අනුව දේශීය ආහාර නිෂ්පාදනය දිරිගැන්වීමේ මෙහෙයුම යටතේ හම්බන්තොට, කුරුණෑගල, පුත්තලම, අනුරාධපුරය හා අම්පාර යන දිස්ත්‍රික්කවල ප්‍රධාන වශයෙන් මිරිස් වගාව දිරිගන්වීමට කටයුතු කෙරේ. මේ තුළින් දේශීය මිරිස් වගාව හා මිරිස් වගා කරන ගොවීන් සම්බන්ධයෙන් පවතින ගැටලු සහ අර්බුදකාරී තත්ත්වයන්ට පිළියම් යෙදීමට උත්සාහ කළ හැකි අතර ඒ අනුව වාර්ෂිකව මිරිස් ආනයනය සඳහා වැයවන විශාල මුදල් ප්‍රමාණයක් රට තුළ ඉතිරි කර ගත හැකිවනු ඇත. එය ශ්‍රී ලාංකික ගොවියාට මෙන් ම මුළුමහත් ජනතාවටම ආර්ථික හා සමාජීය වශයෙන් වාසිදායක තත්ත්වයක් වනු ඇත.


ආශ්‍රිත ග්‍රන්ථ

***HARTI Agricultural Commodity Review, 1998***

*'මිරිස් වගාව', කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, 2004*

*'මිරිස් කරලේ ඛේදවාචකය', පුවත්පත් වාර්තාව අරුණ, 2004 ජනවාරි*



**ආර්.එන්.කේ. රඹුක්වැල්ල**

***පර්යේෂණ නිලධාරිණී***

**අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය**

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය


***********************************

## ගොවි ජනතා

**ගොවි ජනතා** සඟරාවේ පසුගිය කලාප කිහිපයක සීමිත පිටපත් සංඛ්‍යාවක් ඉතිරිව තිබේ. දැනට මෙම කලාපයන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ප්‍රකාශන අලෙවි කවුළුවෙන් / කුටියෙන් මිල දී ගැනීමේ හැකියාව පවතී.

දැනට ඉතිරිව තිබෙන කලාපයන්ගේ තේමාවන් අතර ගොවි සමාගම්/ගොවි ගැටළු, විකල්ප බල ශක්තිය, ගල්ඔය ගොවි ජනපද ව්‍යාපාරය, ජල කළමනාකරණය, ගොවි ණය, සත්ත්ව පාලනය, සංවර්ධන සංන්නිවේදනය, සාම්ප්‍රදායික කෘෂිකර්මය, මල් හා විසිතුරු පැල ආදිය වේ.

අවශ්‍ය කලාප සංඛ්‍යාව සඳහන් කොට, අදාළ ගෙවීම් මුදල් ඇනවුමකින් ආයතනය වෙත ලැබෙන්නට සැලැස්වීමෙන් අවශ්‍ය පිටපත් ප්‍රමාණය ලබාගත හැකිය.

**සියළු මුදල් ඇනවුම්**


අධ්‍යක්ෂ
ගොවි ජනතා
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ - 07.
දුරකතන 2696981,2698539-41